# සියම් උපසම්පදාව ලක්දිව පිහිටුවීම

**හසිත චාමිකර ගුණසිංහ**

සහකාර කථිකාචාර්ය, ඉතිහාසය අධ්‍යයන අංශය

hachagu@gmail.com

**සංක්ෂේපය**

අනුරාධපුර රාජධානි සමයේදී මෙරට බෞද්ධ පැවිදි උපසම්පදාව ස්ථාපනය කිරීමෙන් අනතුරුව භික්ෂූන් වහන්සේ සහ පාලක පක්ෂය එය අඛණ්ඩව පවත්වා ගෙන යාමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලදී. වරින් වර රට තුළ ව්‍යාකූල තත්ත්ව ඇතිවී උපසම්පදා කර්මය පරිහානියට පත්වුව ද, එකී තත්ත්ව මග හරිමින් සිහසුන් පැමිණි පාලකයන් විසින් බුරුමය, රක්ඛංග දේශය හා සියම වැනි අග්නිදිග ආසියාතික බෞද්ධ රටවල්වලින් උපසම්පදා භික්ෂූන් වහන්සේ වැඩම කරවා උපසම්පදාව නැවතත් පිහිටුවීමට කටයුතු කරනු ලැබ තිබේ.

එහෙත් කෝට්ටේ සහ සීතාවක රාජධානි බිඳ වැටී කන්ද උඩරට නව රජ පෙළපතක් ස්ථාපනය වීම අතරතුර කාලයේ රටේ පැවති ව්‍යාකූල තත්ත්වය හමුවේ නැවත වරක් උපසම්පදාව පරිහානියට පත්වුණි. අනතුරුව අවස්ථා දෙකකදී එනම් පළමුවන විමලධර්මසූරිය සහ දෙවන විමලධර්මසූරිය රාජ සමයන්හිදී රක්ඛංග දේශයෙන් උපසම්පදා භික්ෂූන් වහන්සේ වැඩම කරවා උපසම්පදාව ඇතිකළ ද, එය පැවතියේ කෙටි කාලයක් පමණි. මෙනිසා භික්ෂු සමාජය තුළ නැවතත් පරිහානිකර තත්ත්වයක් ඇතිවිය. පෙරවූ සිවුරට පමණක් භික්ෂුත්වය සීමා කොටගෙන ගති පැවතුම් අතින් ගිහියන්ට සමාන වූ ගණින්නාන්සේලා නමින් හැඳින්වූ පිරිසක් මෙම කාලය තුළ භික්ෂු සමාජයේ ඇති වූ නමුත් ලාංකේය සංස්කෘතිය සුරැකීමට ඔවුන්ගෙන් සේවාවක් සිදු නොවූවා නොවේ.

මෙම තත්ත්වය මඟ හැර පිරිසිදු උපසම්පදාව නැවතත් ඇති කිරීමට වැලිවිට සරණංකර සාමණේරයන් පුරෝගාමී වූ අතර උන්වහන්සේ විසින් සිහසුනේ සිටි රජවරුන්ට මේ පිළිබඳ නිතර සිහි කැඳවමින් දැඩි ප්‍රයත්නයක් දරනු ලැබීය. දුෂ්කර ප්‍රයත්න කීපයක් අවසානයේ සියම් දේශයෙන් භික්ෂූන් වහන්සේ වැඩම කරවා උපසම්පදාව නැවතත් පිහිටුවාලීමට උන්වහන්සේට හැකිවුණි. සියම් උපසම්පදාව වශයෙන් අද දක්වා පවතින්නේ එකී උපසම්පදාවයි. උඩරට රාජධානිය ආරම්භයේදී ස්ථාපනය කෙරුණු රක්ඛංග උපසම්පදා ද්විත්වයම උපසම්පදා කිරීමකට පමණක් සීමා වූ අතර එය පවත්වා ගෙන යාම සඳහා කිසිදු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොකෙරුණි. එහෙත් සියම් උපසම්පදාව හුදෙක් උපසම්පදා කිරීමකට පමණක් සීමා නොවී අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා ද දිගුකාලීන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වීම හේතුවෙන් අද දක්වා පවත්වා ගැනීමට හැකිව තිබේ.

ප්‍රමුඛ පදඃ

සියම් උපසම්පදාව, වැලිවිට සරණංකර හිමි, කීර්ති ශ්‍රී රාජසිංහ රජු, උඩරට රාජධානිය

**හැඳින්වීම**

අනුරාධපුර රාජධානි සමයේ දෙවනපෑතිස් රජ දවස සිදු වූ මහින්දාගමනයත් සමග මෙරට බුදු සසුන මුල්බැසගත් අතර මිහිඳු මාහිමියන්ගේ උපදෙස් පරිදි ලංකාවේ මව්පියන්ට දාව ලංකාවේ උපන් අරිට්ඨ කුමරු පැවිදි කරවීම සමඟ සඟ සසුන ද ලංකාවේ ස්ථාපිත කෙරුණි. එකී සඟ සසුන අද දක්වා පැවැත එන්මේදී වරින්වර විවිධ උපද්‍රවවලට ලක් නොවූවා නොවේ. එවැනි උපද්‍රව නිසා සඟ සසුනේ වැදගත්ම විනය කර්මය වන උපසම්පදා කර්මය සිදු කිරීමට උපසම්පදාලාභී භික්ෂූන් වහන්සේ නොමැති වීමෙන් සඟ සසුනේ විවිධ පරිහානි ඇති වූ නමුත් තත්කාලීන රජ දරුවන් විසින් නැවතත් උපසම්පදාව පිහිටුවීමට කටයුතු කරනු ලැබූ බව පෙනේ.

මිහිඳු මාහිමියන් විසින් ස්ථාපනය කරනු ලැබූ උපසම්පදාව අනුරාධපුර රාජධානිය බිඳ වැටීම දක්වා පැවති අතර අනතුරුව චෝල ග්‍රහණයෙන් රට මුදාගෙන පොළොන්නරු රාජධානිය ඇරඹූ මහා විජයබාහු රජ දවස බුරුම රටින් භික්ෂූන් වැඩම කරවා නැවත උපසම්පදාව පිහිටුවීමට කටයුතු යෙදුණි. එතැන් පටන් කෝට්ටේ රාජධානිය බිඳ වැටීම දක්වා රජදරුවන්ගේ මැදිහත් වීමෙන් ශාසන කතිකාවත් ඇති කිරීම මෙන්ම උපසම්පදා මංගල්‍ය සිදු කිරීම හේතුවෙන් පිරිසිදු උපසම්පදාව අඛණ්ඩව පවත්වා ගැනීමට භික්ෂූන් වහන්සේලාට හැකියාව ලැබුණි. එහෙත් ඉන්පසු රට තුළ ඇතිවූ ව්‍යාකූල තත්ත්වය හමුවේ උපසම්පදාව නැතිව ගිය හෙයින් අනතුරුව උඩරට රජ පැමිණි පළමුවන විමලධර්මසූරිය රජු විසින් නැවත උපසම්පදාව පිහිටුවීමට කටයුතු කරන ලදී.

සියම් උපසම්පදාව ලක්දිව පිහිටුවීම සහ ඊට පූර්ව කාලය තුළ උපසම්පදාව නැවතත් පිහිටුවීමට ගත් උත්සාහ පිළිබඳ අධ්‍යයනය කිරීමේදී ප්‍රාථමික මූලාශ්‍රය කීපයක් හමුවන අතර එකී මූලාශ්‍රය උපයෝගී කොට ගනිමින් සියම් උපසම්පදාව ලක්දිව පිහිටුවීම පිළිබඳ සවිස්තර අධ්‍යයනයක් මෙම ලිපියෙන් සිදු කොට තිබේ.

**පැවිදි උපසම්පදාව**

බුද්ධ ශාසනයේ පවතින සීලයන් අතුරින් උසස්ම සීලය වශයෙන් උපසම්පදා සීලය පිළිගැනෙන අතර ඒ නිසා එයට අධිශීලය යන නාමය ද ව්‍යවහාර කෙරේ (චන්දවිමල හිමි, 1970:15). පැවිදි බිමට සාමණේරවරයෙකු වශයෙන් ඇතුලු වන පැවිදි අපේක්ෂකයා විසින් අනතුරුව උපසම්පදා සීලය ලැබීම සඳහා සුදුසු තත්ත්වයට පත්වීමෙන්, සංඝ කර්ම සඳහා නියමිත සීමා මාලකයකට රැස්වුණු භික්ෂු සංඝයාගෙන් උපසම්පදාව ඉල්ලා සිටීම සිදු කරනු ලබයි. එහිදී බුද්ධාඥාව පරිදි ඥප්තිචතුර්ථකර්මයෙන් මහා සංඝයා වහන්සේ විසින් උපසම්පදා අපේක්ෂකයා උපසම්පදා සීලයේ පිහිටවනු ලැබේ. එතැන් පටන් බුදුරජාණන් වහන්සේගේ උසස්ම ශ්‍රාවක පිරිස වශයෙන් ගැනෙන භික්ෂු ගණයට එකී සාමණේරයන් උසස් වන අතර භික්ඛු යන නාමය ද, සංඝ කර්මවලට සහභාගි වීමේ අයිතිය ඇතුලු වරප්‍රසාද රැසකට හිමිකම් කීමට හැකියාව ලබාගනු ලැබේ (චන්දවිමල හිමි, 1970:33-34).

**උඩරට ස්ථාපිත කළ රක්ඛංග උපසම්පදා ද්විත්වය**

වර්ෂ 1590 දී පමණ කන්ද උඩරට රාජධානිය ස්ථාපනය කළ පළමුවන විමලධර්මසූරිය රජු රාජධානියේ ආරක්ෂාව සේම ආර්ථිකය නගා සිටුවීමට කටයුතු කළ අතර ශාසනික වශයෙන් ද විශාල වැඩ කොටසක් සිදු කරන්නට යෙදුණි. ඒ යටතේ නැවත උපසම්පදාව ප්‍රතිෂ්ඨාපනය කොට ශාසන චිරස්ථිතිය ඇතිකිරීම සඳහා රක්ඛංග දේශයට දූත පිරිසක් පිටත් කොට නන්දිචක්ක සහ චන්දිවිසාල යන මහා ස්ථවිරයන් දෙනම ඇතුලු තවත් භික්ෂූන් වහන්සේ දස නමක් මෙරටට වැඩම කරවා, බු.ව. 2140 දී (ක්‍රි.ව. 1596) ගැටඹේහිදී උපසම්පදා මංගල්‍යයක් පැවැත්වීමට රජු අනුග්‍රහය දැක්වී ය (*ස්‍යාමොපසම්පදාවත*, 1998:47-*සමො*). ඒ අවස්ථාවේදී බොහෝ කුලපුත්‍රයන් උපසම්පදා කරවීම මෙන්ම පැවිදි කරවීම ද සිදුකොට තිබේ (*මහාවංසය-සිංහල*, 2003:446).

එකී උපසම්පදාව ඉතාමත් කෙටි කාලයක් තුළ නැවත වරක් පරිහානියට පත්වුණු අතර (*සඟරජවත*, 1955:46 කවිය-*සව*) පළමුවන විමලධර්මසූරිය රජුගෙන් ඇවෑමෙන් රජ පැමිණි සෙනරත් සහ දෙවන රාජසිංහ රජවරුන් විසින් උපසම්පදා මංගල්‍ය නොපැවැත්වීම ද එම පරිහානියට හේතු වූ බව කියැවේ (*සමො*,1998:55). *රක්ඛංගදේශ දූත ප්‍රයාණය* නම් ලේඛනයට අනුව දෙවන රාජසිංහ රජු ඇවෑමෙන් රජ පැමිණි දෙවන විමලධර්මසූරිය රජ දවස නැවත වරක් රක්ඛංග දේශයෙන් උපසම්පදාව ගෙන ඒමට දූතයන් පිටත් කෙරුණු අතර රක්ඛංග රාජ නිලධාරීන් ලංකාවේ උපසම්පදාව නැතිව ගොස් කොපමණ කලක්දැයි ඔවුන්ගෙන් විචාල අවස්ථාවේදී වසර තිහක් පමණ යැයි පිළිතුරු ලබා දුන් බව සඳහන් වේ (ධම්මානන්ද හිමි, 1969:85). මෙකී රක්ඛංග දූත මෙහෙවර සිදුවූයේ ශ.ව. 1615 දී හෙයින් වසර 30 කට පෙර කාලය එනම් ශ.ව. 1585 (ක්‍රි.ව. 1663) වන අතර ඒ කාලය තුළ සිහසුනේ සිටි පාලකයා වූයේ දෙවන රාජසිංහ රජුයි.

එකල සිරකරුවෙක් ලෙස උඩරට රඳවා ගෙන සිටි ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස්ගේ *An Historical Relations of Island of Ceylon* කෘතියේ දක්වෙන අන්දමට එකල උඩරට තෙරුන් වහන්සේ (Tirinaxes) නමින් හැඳින්වුණු පිරිසක් හා ගණින්නාන්සේලා (Gonni) නමින් හැඳින්වුණු පිරිසක් ද සිටි බව පෙනේ. ගණින්නාන්සේලා සිවුරක් පෙරවා උඩින් බඳ පටියක් බැඳ සිටි බව

නොක්ස් දක්වන නමුත් ඔවුන් අඹුදරුවන් පෝෂණය කිරීම ආදී කටයුතු සිදුකළ බවක් නොදක්වයි (Knox, 2004:74). ඒ නිසා දෙවන රාජසිංහ සමය වන විට උපසම්පදාව ක්‍රමික පරිහානියකට පත්වෙමින් පැවැති බව පෙනෙන්නට තිබේ.

අනතුරුව රජ පැමිණි දෙවන විමලධර්මසූරිය රජු විසින් සාමණේරවරුන් බොහෝ සිටිය ද එකදු උපසම්පදාලාභී භික්ෂුවක් හෝ ලක්දිව නොමැති නිසා නැවත උපසම්පදාව පිහිටුවීමේ අරමුණින් රක්ඛංග දේශයට දූතයන් පිටත් කර හැරීමට කටයුතු කළ අතර (*සමො*, 1998:50) මේ දූත මෙහෙවර සඳහා දොඩංවල හේරත් මුදියන්සේ, බැමිණිවත්තේ දිසානායක මුදියන්සේ, ගම්පහේ විජේතුංග මුදියන්සේ, සිවාගම පණ්ඩිත මුදියන්සේ, අතපත්තුවේ ලේකම් ගලගම මොහොට්ටාල යන පස්දෙනා සහභාගි වී තිබේ. මෙම දූත මෙහෙවරේ ප්‍රතිඵලයක් ලෙස ශන්තාන හා ලොංගාපුශ්‍රී මහාස්ථවිරවරුන් (සන්තාන හා ලෝකරාගපුද්ගලි ලෙස ද යෙදේ) ඇතුලු භික්ෂූන් වහන්සේ තිස්තුන් නමක් මෙරටට වැඩම කෙරුණු අතර (ධම්මානන්ද හිමි, 1969:89) උන්වහන්සේලා විසින් ගැටඹේහිදී සාමණේරවරුන් තිස් තුන් නමක් උපසම්පදා කරවා තවත් කුල දරුවන් එකසිය විසි නමක් පැවිදි කරවන්නට කටයුතු කරන ලදී. මෙම උපසම්පදා මංගල්‍යය ක්‍රි.ව. 1696/1697 (බු.ව. 2240) කාලයේදී සිදුවූ බව *ස්‍යාමොපසම්පදාවත* දක්වයි (*සමො*, 1998:50).

මේ සඳහා රක්ඛංග දේශයෙන් වැඩම කළ භික්ෂූන් වහන්සේ ගණන පිළිබඳ මූලාශ්‍රය අතර ඇත්තේ පරස්පරතාවකි. *රක්ඛංගදේශ දූත ප්‍රයාණය* හා *අරත්තනතුඩපතේ* රක්ඛංග භික්ෂූන් වහන්සේ තිස්තුන් නමක් වැඩම කළ බව දැක්වුණ ද (ධම්මානන්ද හිමි, 1969:89,174-176), *ස්‍යාමොපසම්පදාවතට* අනුව වැඩම කොට ඇත්තේ භික්ෂූන් වහන්සේ තිස් නමකි (*සමො*, 1998:50). මෙම පරස්පරතාව ඇති වූයේ වැඩම කළ රක්ඛංග භික්ෂූන් වහන්සේ ගණන සඳහන් කිරීමේදී ඇතිවූ දෝෂයක් නිසා විය යුතු ය.

මේ හැරෙන්නට රජු විසින් සියමේ බුදුදහම පිළිබඳ තොරතුරු සෙවීම සඳහා වර්ෂ 1789 දී ලන්දේසි ජාතික රෝන්ද්‍රා කෞමන්ගේ නායකත්වයෙන් දූත කණ්ඩායමක් පිටත් කරනු ලැබූ අතර එයට සිංහලයන් ඇතුළත් නොවූ බව කියැවේ. මේ පිරිස සියමේ අයෝධ්‍යාපුර රජු හමුවී තොරතුරු විමසා බලා නැවත ලංකාවට පැමිණි බව තිබේ (වාචිස්සර හිමි, 2003:133-134).

අනතුරුව රජ පැමිණි ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු පියරජු දවස උපසම්පදා කරවූ භික්ෂූන් වහන්සේ සමීපයේ කුල දරුවන් පැවිදි කරවමින් සසුන පවත්වා ගැනීමට උපකාරී වූ බව *ස්‍යාමොපසම්පදාවත* දැක්වුව ද, (*සමො*, 1998:51) එය උපසම්පදාව අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා රුකුල් දුන් බවක් නොපෙනේ. මන්දයත් උපසම්පදාව අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා කළ යුත්තේ කුල දරුවන් පැවිදි කරවීම නොව සාමණේරවරුන් උපසම්පදා කිරීම පමණක් වීමෙනි. මෙරට සියම් උපසම්පදාව පිහිටුවීම සඳහා පුරෝගාමී මෙහෙවර ඉටු කරනු ලැබූ වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් පැවිදි බිමට ඇතුළත් වන්නේ මෙකී කාලවකවානුවේදී ය.

**සියම් උපසම්පදාව පිහිටුවීම සඳහා පසුබිම සැකසීම**

තුම්පනේ වැලිවිට ග්‍රාමයේ උපන් කුලතුංග බණ්ඩාර නමින් හැඳින්වුණු කුල දරුවා වයස අවුරුදු දහසයේදී වැලිවිට සරණංකර නමින් සූරියගොඩ හිමියන්ගෙන් පැවිද්ද ලබා ගත් අතර (*සමො*, 1998:55 සහ *සංඝරාජ සාධු චරියාව*, 1997:3-*සංසාච*) සූරියගොඩ හිමියන් දෙවන විමලධර්මසූරිය සමයේ රක්ඛංග උපසම්පදාව ලැබූ හිමිනමක් බව කියැවේ (*සමො*, 1998:55) මේ කාලය වන විට නැකැත් බැලීම, වෙදකම්, ගොවිතැන් මෙන් ම වෙළදාම් ද සිදු කරමින් රන් රිදී පිළිගනිමින් මිථ්‍යාජීවයේ යෙදෙමින් ස්ත්‍රීන් සේවනය කරන දුසිල් මහණුන් සිටි හෙයින් "නැසී ගිය සසුන් පිළිවෙත් කෙසේ උපදවම්ද" යන සිතුවිල්ල සරණංකර සාමණේරයන්ට ඇතිවූ බව *සංඝරාජ සාධුචරියාව* දක්වයි (*සංසාච*, 1997:3).

එකල්හි දුසිල් මහණුන් ක්‍රියා කළ අයුරු *සඟරජවත* හෙළා දකින්නේ මෙලෙසිනි:

දහම් ලෙස නො හැසිර
කුල දූසනය කර කර
බණ නො ඉගෙන පවර
නැකැත් වෙදකම් පුරුදු කැර කැර

| | |
|---|---|
| සැදැහැත්තන් | පුදන |
| නොයෙක් පූජා | ලබමින |
| නැයන්ට | බෙදමින |
| නිමල සස්නේ කසළ | තවරන |

(*සව*, 1955:58,61 කවි)

එවන් තත්ත්වයක් තුළ පිරිසිදු උපසම්පදාව ස්ථාපනය කොට සසුන රැක ගැනීමේ අරමුණ පෙරදැරිව නරේන්ද්‍රසිංහ රජුගේ අනුග්‍රහය ලබා ගැනීමට සරණංකර සාමණේරයෝ නිරතුරුව උත්සුක වූහ. ඒ යටතේ පළමු කොට රජුගේ සිත් දිනා ගැනීම උදෙසා ග්‍රන්ථකරණයේ යෙදීම මෙන්ම පසුව රාජ සභාවට පැමිණි බමුණෙකු සමග කිසිවෙකුටත් කතා කිරීමට නොහැකිව තිබියදී පාලියෙන් කතා බස් කොට බමුණාගේ සිත් පහදවා ගැනීම, නියමකන්දේ අධ්‍යාපන ආයතනයක් ඇරඹීම ආදිය සාමණේරයන් විසින් සිදු කරනු ලැබූව ද උපසම්පදාව සොයා විදෙස් ගත වීමට රජුගෙන් කිසිදු සහයක් නොලැබුණි (*සංසාව*, 1997:8-15). වරෙක සරණංකර සාමණේරයන් විසින් උපසම්පදා ගෙන එන්නට විදේශයකට යන ගමනේදී කිසියම් අමනුෂ්‍යයෙකු විසින් බිල්ලක් ඉල්ලා සිටියොත් තමන්වහන්සේ ඒ සඳහා කැපවන බව පාලි සන්දේශයකින් දක්වා රාජානුග්‍රහය ඉල්ලා සිටිය ද ඉන් පලක් වූ බවක් නොපෙනේ (ධම්මානන්ද හිමි, 1969:146-147).

එහෙත් නරේන්ද්‍රසිංහ රජු ඇවෑමෙන් අගබිසවගේ සොයුරා ශ්‍රී විජය රාජසිංහ නමින් සිහසුනට පත්වූයෙන් සරණංකර සාමණේරයන්ගේ අපේක්ෂා නැවතත් දළුලා වැඩුණු බව පෙනේ. එයට හේතුව වූයේ කුමරු සිහසුනට පත්වීමට ප්‍රථම උන්වහන්සේ සමීපයේ ශිල්ප හදාරා උන්වහන්සේගේ යෝජනාවකින් සිහසුනට පත්ව සිටීමයි (*මන්දාරම්පුර පුවත*, 1958:510-521 කවි- *මපුපු*).

*මන්දාරම්පුර පුවතේ* දැක්වෙන අන්දමට දිනක් රජු සරණංකර සාමණේරයන් බැහැදැක තමන්ට හට ශිල්ප ශාස්ත්‍ර උගන්වා පසුව ලක් රජය ද හිමි කරදුන් හෙයින් කුමක් ලබනු රිසිදැයි විචාල අතර උපසම්පදාව පිහිටුවා සසුන රකින මෙන් සාමණේරයෝ රජුගෙන් ඉල්ලා සිටියහ. එවිට කෙසේ උපසම්පදාව ලබා ගනිම්දැයි රජු විමසූ විට, සිදුහත් කුමරු උපන් හා බුදු වූ ස්ථාන සහ දම්සක් දෙසුම පැවැත්වූ ස්ථාන වැඳ පුදාගෙන පිරිසිදු උපසම්පදාව ඇති ස්ථානයකින් එය රැගෙන ඒමට තමන්වහන්සේ පිටත් කර හරින්නැයි සාමණේරයන් විසින් ඉල්ලා සිටින ලදී. එහෙත් මුහුද තරණය බිහිසුණු හෙයින් උන්වහන්සේට හානියක් වුවහොත්, ලක්දිවට වෙනත් පිළිසරණක් නොමැති හෙයින් ඒ සඳහා වෙනත් සාමණේරවරුන් පිරිසක් පිටත් කර යැවීමට රජු එකඟත්වය පළ කළේ ය. මුහුද තරණය කොට උපසම්පදාව සෙවීමට පිටත් වීම සඳහා සරණංකර සාමණේරයන්ට අවසර ලබාදීම රජු විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් පැහැදිලිවන්නේ උන්වහන්සේ පිළිබඳ රජු තුළ පැවති ඉමහත් ගෞරවය සහ හිතෛෂී භාවයයි. මරම්ම, රක්ඛංග, මොංගොලි, කොරි, චීන යන රාජ්‍යවල ඇති බුදු සමය වියවුල් එමෙන්ම දේවාගම් සමග මිශ්‍රව ද ඇති හෙයින් එවන් රටකින් ලැබෙන උපසම්පදාව ඵලක් නොවන බව සාමණේරයන් රජුට දැන්වූ අතර පිරිසිදු උපසම්පදාව ඇති රටකින් උපසම්පදාව ලබාදීමට රජු සපථ විය. ඒ නිසා දඹදිව මධ්‍ය මණ්ඩලය හෝ අරමණ, සියම් රටට දූතයන් යවන මෙන් සාමණේරයෝ රජුගෙන් ඉල්ලා සිටියහ. අනතුරුව ඕලන්ද නැව් දෙකක් ලබාගෙන උරුලෑවත්තේ සහ මැදගම යන සාමණේරවරුන් දෙනම සමඟ හිප්පොළ, පුස්සලමංකඩ, උඩුව, ගංතලේ හා අන්දරවැව යන නිලධාරීන් ඇතුලු දූත කණ්ඩායමක් උපසම්පදාව පිළිබඳ සොයා බැලීමට රජු විසින් පිටත් කර හරින ලදී. දඹදිව, අරමණ, මරම්ම, සියම යන රාජ්‍යයන්ගේ තොරතුරු සොයා බැලූ මෙම කණ්ඩායම ආපසු පැමිණ සියම් රට පමණක් ලක්දිව අනුරාධපුර මහා විහාර සඟ පරපුරෙන් පැවත එන භික්ෂූන් වැඩ සිටින බව රජුට දන්වා සිටියේ ය (*මපුපු*, 1958:559-579 කවි).

**සියමට පිටත් කෙරුණු පළමු හා දෙවන දූත මෙහෙවර**

දූත කණ්ඩායමේ තොරතුරු පාදක කොටගෙන උපසම්පදා භික්ෂූන් වහන්සේ අයදිමින් පාලි බසින් රචිත සන්දේශයක් සහිතව දූත පිරිසක් සියමට පිටත් කර හැරීමට රජු කටයුතු කළ අතර එකී දූත පිරිසට අයත් වූයේ ගිහි බවට පත් කරවූ ආරගොඩ, ගණේගොඩ, ලිඳපිටියේ, වටවන හා හල්පේ යන සාමණේරවරුන් ද, දොරණගම මුහන්දිරම් හා මාතොට රාළ යන රාජ නිලධාරීන් දෙදෙනා ද, වටවන උපාසකරාළ නම් පුද්ගලයා සහ කුඩා දරුවෙකු ය. එහෙත් පයිගොවු නම් දේශය

ආසන්නයේදී නැව මුහුදුබත් වීමෙන් දිවි ගලවා ගැනීමට හැකිවූයේ රාජ නිලධාරීන් දෙදෙනා, වටවන උපාසකරාළ හා කුඩා දරුවාට පමණකි. අනතුරුව එල්ලවුණු සොරුන්ගේ ප්‍රහාරයකින් දිවි ගලවා ගෙන නැවතත් මෙරටට පැමිණීමට සමත් වූයේ දොරණාගම මුහන්දිරම් පමණක් බව මේ දූත මෙහෙවර පිළිබඳ සවිස්තර තොරතුරු දක්වන *සංඝරාජ සාධු චරියාව* දක්වයි (*සංසාච*, 1997:16).

එහෙත් මෙම දූත මෙහෙවර පිළිබඳ කිසිදු තොරතුරක් සියම් උපසම්පදාව පිහිටුවීම පිළිබඳ දීර්ඝ විස්තර දක්වන *මන්දාරම්පුර පුවතේ* සහ *පුණ්‍යක්‍රියා සන්දේශයේ* දැකගත නොහැකි වීම විශේෂ ය. මෙම දූත මෙහෙවරින් කිසිදු සාර්ථකත්වයක් ලබාගැනීමට ලාංකික දූතයන්ට නොහැකි වූ හෙයින් ඒ පිළිබඳ සඳහන් කිරීම නොවැදගත් ය යන හැඟීමේ පිහිටා ලේඛකයන් කටයුතු කිරීම එයට හේතු වන්නට ඇත.

පළමු අවස්ථාවේදී සියම් දූත මෙහෙවර අසාර්ථක වුව ද, ඉන් පසුබට නොවූ සරණංකර සාමණේරයන් ශ.ව. 1668 දී දෙවැනි දූත කණ්ඩායම සියමට පිටත් කිරීමට කටයුතු කළ අතර එයට අයත්වූයේ මීදෙණියේ මුහන්දිරම්, විල්බාගෙදර මුහන්දිරම් හා පළමු දූත ගමනේදී නිරුපද්‍රිතව ආපසු පැමිණීමට සමත් වූ දොරණාගම මුහන්දිරම් යන රාජ නිලධාරීන් සහ ගිහි බවට පත් කළ වැල්ලාවේ, ගලටොඹුවේ, දැලිවල, බෝතලේ සහ ඕගඩපල නම් සාමණේරවරුන් ය (ධම්මානන්ද හිමි, 1969:226). එකී දූත මෙහෙර අතරතුර සියම් රටේදී දොරණාගම මුහන්දිරම් මියගිය ද අනෙක් දූත පිරිස ධාර්මික නම් සියම් රජු* බැහැ දැක දූත මෙහෙවරේ අරමුණ දැනුම් දීමට සමත් විය (*සංසාච*, 1997:16).

ඒ අවස්ථාවේදී ලක්දිව උපසම්පදාව පිහිටුවීම සඳහා අවශ්‍ය සහය ලබාදීමට සියම් රජු එකඟ වුව ද, හදිසියේ ශ්‍රී විජය රාජසිංහ රජු වියෝවූයෙන් එකී එකඟත්වයේ වෙනසක් වූ බව පෙනේ (*සමො*, 1998:56). නව රජු වශයෙන් පත්වන්නා ශ්‍රද්ධාවන්ත අයෙකු නොවේ නම් ලක්දිවට පැමිණෙන සියම් දූතයන්ට අනදරයක් විය හැකි හෙයින් නව රජුගේ අදහස් දැන නැවත පැමිණි විට උපසම්පදාව පිහිටුවීම සඳහා අවශ්‍ය සහයෝගය තමන් ලබාදෙන බව සියම් රජු විසින් සපථ කරන ලදී (*සව*, 1955:115-118 කවි සහ *මපුපු*, 1958:584-586 කවි). මෙනිසා ආපසු ලංකාවට පිටත් වුණු උඩරට දූත පිරිසෙන් නිරුපද්‍රිතව සියරටට පැමිණියේ විල්බාගෙදර මුහන්දිරම් පමණි (*සංසාච*, 1997:16-17).

ශ්‍රී විජය රාජසිංහ රජු ඇවෑමෙන් සිහසුන් පැමිණි කීර්ති ශ්‍රී රාජසිංහ රජු ද සරණංකර සාමණේරයන් බැහැ දැක තමන් සිප් සතර උගෙන, රාජත්වය ලැබුවේ උන්වහන්සේ නිසාවෙන් තමන්ගෙන් විය යුතු මෙහෙය විචාළේ ය. එවිට පෙර පරිදිම උපසම්පදාව පිහිටුවීමට ආධාර කරන ලෙස සාමණේරයෝ රජුගෙන් ඉල්ලා සිටියහ (*මපුපු*, 1958:647-651 කවි). "මා දවස බුදුස්සන බබුළුවා ලන්නෙමි" යන අරමුණ පෙරටුකොට ගෙන ක්‍රියා කළ රජු, සාමණේරයන්ගේ ඉල්ලීම පිළිගෙන පට්ටිපොළ මොහොට්ටි නිළමේ, ඇල්ලේපොළ මොහොට්ටි නිළමේ, යටිනුවර ඊරිගම නිළමේ, විල්බාගෙදර නිළමේ සහ ආයිත්තලියද්දේ නිළමේ ප්‍රධාන දූත කණ්ඩායමක් සියම බලා පිටත් කර හැරීමට කළේ ය (*සමො*, 1998:56-57).

*ස්‍යාම වණ්ණනාවේ* දැක්වෙන අන්දමට මෙම දූත කණ්ඩායමට අයත් වූ පට්ටපොළ මොහොට්ටාල අතපත්තුවේ ලේකම් ලෙස ද, ඇල්ලෙපොළ මොහොට්ටාල වෙඩික්කාර ලේකම් ලෙස ද, ඊරිගම රාළ නානායක්කාර ලේකමේ යටිනුවර මුහන්දිරම් වසම බාර නිලධාරියා ලෙස ද, විල්බාගෙදර රාළ පඩික්කාර ලේකමේ තුන්පනහේ මුහන්දිරම් ලෙස ද, අයිත්තාලියද්දේ රාළ වෙඩික්කාර ලේකමේ දුම්බර මුහන්දිරම් ලෙස ද ඒ වනවිට කටයුතු කරමින් සිට තිබේ (*ස්‍යාම වණ්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ නානාපති ගමන*, 1998:37-*ස්‍යාව*).

මෙම දූත මෙහෙවර සඳහා ගිහි බවට පත්කළ සාමණේරවරුන් සහභාගි නොවූ අතර (*සංසාච*, 1997:17) කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ සන්නස ද, වැලිවිට සරණංකර සාමණේරයන් විසින් ලියූ පාලි සන්දේශයක් හා අස්ගිරි විහාරයේ ගොලහැන්වත්තේ ධම්මදස්සී සාමණේරයන් විසින් ලියූ පාලි සන්දේශයක් සහිතව (*ස්‍යාව*, 1998:84) උඩරට දූත කණ්ඩායම ශ.ව. 1672 දී ත්‍රිකුණාමලයෙන් සියම

* ධාර්මික/ධාම්මික යන නම්වලින් සිංහල ලේඛනවල හැඳින්වෙන මෙම රජුගේ රජුගේ සැබෑ නම බොරොමකොත් (Somdet Phrachaoyuhua Borommakot) වූ අතර වර්ෂ 1732-1758 කාලය තුළ අයෝධ්‍යා හෙවත් අයුත්තය රාජධානියේ සිහසුන ඉසිලීය.

බලා නැව් නැගී අතර ශ.ව. 1673 දී සියමට පැමිණීමට සමත් විය (*සමෛ,* 1998:57). මේ ගමන සඳහා ඕලන්ද නැවක් යොදා ගත් බව *මන්දාරම්පුර පුවත* දක්වන අතර (*මපුපු,* 1958:563-654 කවි) එකී නෞකාවේ නම තාර්කා නම් වූ බව *සයාම වණීනාව* දැක්වුව ද, විල්බාගෙදර මුදියන්සේ විසින් සියම් දූත මෙහෙවර සම්බන්ධව ලියූ වාර්තාවේ මෙම නැවේ නම වෙල්තක්ක නම් වූ බව කියයි (*සයාව,* 1998:41,85). ඔහු මෙකී දූත කණ්ඩායමේ සාමාජිකයෙකු වූ හෙයින් ඔහුගේ ප්‍රකාශය නිවැරදි විය යුතු ය.

සියමට පැමිණි දූත පිරිස පළමුව අයෝධ්‍යා පුරයේ යුවරජු බැහැ දැකීමට පිටත් වූ අතර අනතුරුව නගරය නැරඹීම හා වෙහෙර විහාර වන්දනා කිරීම සිදුකොට තිබේ. කඨින පූජා පිංකමකට ද, සියම් ගඟේ පහන් පූජාවකට හා සියමේ ශ්‍රී පාදය වන්දනා කිරීමට ද ඔවුන් එහිදී සහභාගි වූ බව කියැවේ. ලාංකික දූතයන්ට මේ සෑම අවස්ථාවකදීම විශේෂ ගරු සැළකිලි හිමිව තිබේ (*සයාව,* 1998:42-65). අනතුරුව සියම් රජු බැහැදුටු උඩරට දූතයන් විසින් දූත මෙහෙවරේ අරමුණ දැන්වීමත් සමග රජුගේ අවසරය එයට හිමිවුණු අතර රජු සියම් සංඝරාජ හිමියන් ප්‍රමුඛ මහ තෙරුන් වහන්සේලාගේ අවසර පරිදි ලංකාවට පිටත් කර හරින භික්ෂූන් වහන්සේ තෝරාගැනීමට අනතුරුව කටයුතු කළ බව කියැවේ (*සමෛ,* 1998:58). එහිදී ප්‍රවර උපාලි මහ තෙරුන්ගේ නායකත්වය යටතේ භික්ෂූන් වහන්සේ පිරිසක් ලක්දිවට පිටත් කර හැරීමට තීරණය කෙරුණු අතර එකී කණ්ඩායමට අයත් වූ භික්ෂූන් වහන්සේ පිළිබඳ මූලාශ්‍රය අතර පවතින්නේ පරස්පරතාවකි.

*සයාමොපසම්පදාවත* දක්වන අන්දමට ප්‍රවර උපාලි මහාස්ථවිරයන් හැරුණු කොට කම්මවාගාචාර්යවරුන් වූ ආර්යමුනි, මහානාම, බ්‍රහ්මජෝති, මහාපුඤ්ඤ, චන්දසාර, සාරචන්ද සහ මණිජෝති යන හිමිවරුන් ද චන්දජෝති, ඉන්දසුවණ්ණ, බ්‍රහ්මස්සර, යසදින්න, මහාසුවණ්ණ, මණිසාර, ධම්මජෝති, මහාමුනි, පුඤ්ඤජාත සහ ඉන්දජෝති යන හිමිවරුන් සහ සාමණේරවරුන් සත් නමක් මෙම කණ්ඩායමට ඇතුළත්ව තිබේ (*සමෛ,* 1998:58).

*සයාම වණීනාවට* අනුව උපාලි මහ තෙරුන් හැරුණු කොට අරියමුණි, මහානාම, බ්‍රහ්මජෝති, මහාපුඤ්ඤ, ඉන්ද්‍රජෝති, චන්ද්‍රජෝති, මණිජෝති, චන්ද්‍රසාර, කොට්ඨීත, ඉන්ද්‍රසුවර්ණ, බ්‍රහ්මස්සර, යසදින්න, මහාසුවර්ණ, ධම්මජෝති, මහාමණිසාර, මහාමුනි, පුඤ්ඤජාත, සරචන්ද්‍ර, මහාමුනි, බ්‍රහ්මස්සර යන හිමිවරුන් ඇතුලු භික්ෂූන් වහන්සේ 28 නමක් සහ සාමණේරවරු අට නමක් මෙම කණ්ඩායමට ඇතුළත්ව තිබේ (*සයාව,* 1998:66).

*විල්බාවේ මුදියන්සේගේ වාර්තාවට* අනුව ප්‍ර උපාලි මහ තෙරුන් හැරුණු කොට ප්‍ර අරිමුන, මහා ඉන්ද්‍රස්වර්ණ, මහාබ්‍රහ්මසර, මහාස්වර්ණ, මහාමනිරස, මහධම්මජොති, මහාමුණ, මහාචන්ද්‍රස්වර්ණ, මහාඅස්සම්, මහා පංඤ්ඤාස, මහාසාරචන්දන, මහාපුඤ්ඤජාතො, මහාචන්දසර, මහාඉන්දජෝත, මහාබුවජොත, මහරඨ, මහාචන්දජොත යන හිමිවරුන් සහ හා සාමණේරවරු සත් නමක් මෙම කණ්ඩායමට ඇතුළත්ව තිබේ (*සයාව,* 1998:102-103).

*මන්දාරම්පුරපුවතට* අනුව උපාලි තෙරුන්, අරියමුනි හා මහානාම තෙරුන්ට අතිරේකව තවත් දස වර්ගික භික්ෂූන් ලංකාවට වැඩම කොට තිබෙන අතර (*මපුපු,* 1958:661-662 කවි) *රක්ඛංගදේශදූතප්‍රයාණයට* අනුව උපාලි මහ තෙරුන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේ දහඅටනමක් සියමෙන් මෙරටට වැඩම කොට තිබේ (ධම්මානන්ද හිමි, 1969:102). *පුණ්‍යක්‍රියා සන්දේශයට* අනුව උපාලි මහ තෙරුන්, ආයුෂ්මුණි මහ තෙරුන් සහ තවත් භික්ෂූන් වහන්සේ විසිහය නමක් මෙරටට වැඩම කොට තිබේ (ධම්මානන්ද හිමි, 1969:233).

මෙම ලැයිස්තු සැසඳීමේදී *සයාමොපසම්පදාවත, සයාම වණීනාව, විල්බාගෙදර මුදියන්සේගේ වාර්තාවේ* දැක්වෙන භික්ෂූන් වහන්සේලාගේ ලැයිස්තු බොහෝ විට සැසඳෙන බව පෙනෙන්නට තිබේ. එහෙත් *සයාමොපසම්පදාවත* සහ *සයාම වණීනාවේ* සඳහන් වන මහානාම, මහාපුඤ්ඤ, මණිජොති සහ යසදින්න යන හිමිවරුන්ගේ නම් *විල්බාගෙදර මුදියන්සේගේ වාර්තාවේ* නොදැක්වෙන අතර ඒ වෙනුවට මහාචන්ද්‍රස්වර්ණ, මහාඅස්සම්, මහා පංඤ්ඤාස, මහරඨ නම් හිමිවරුන් පිළිබඳ එහි දක්වා ඇත. එසේම *සයාම වණීනාව* සහ *සයාමොපසම්පදාවතේ* නාම ලේඛන එකිනෙකට සමානකමක් දැක්වුව ද, මහාමුනි සහ බ්‍රහ්මස්සර යන නම් දෙවරක් යෙදී තිබීම සහ කොට්ඨීත නම් හිමි නමකගේ නමක් දක්වා තිබීම හේතුවෙන් එය වෙනස් සොබාවයක් ගෙන තිබේ.

මේ හැරෙන්නට වැඩම කළ භික්ෂූන් වහන්සේ ගණන දැක්වීමේදී *ස්‍යාමොපසම්පදාවත*, *විල්බාගෙදර මුදියන්සේගේ වාර්තාව* සහ *රක්ඛංගදේශදූත ප්‍රයාණයට* අනුව මෙරටට සියම් භික්ෂූණ් දහ අට නමක් වැඩම කොට තිබෙන නමුත් *ස්‍යාම වණ්ණනාව* සහ *පුණ්‍යක්‍රියා සන්දේශයට* අනුව සියම් භික්ෂූන් විසි අට නමක් සහ *මන්දාරම්පුරපුවතට* අනුව සියම් භික්ෂූන් දහ තුන් නමක් වැඩම කොට තිබේ. වැඩම කළ සියම් සාමණේරවරුන් ගණන පිළිබඳ *මන්දාරම්පුර පුවත*, *පුණ්‍යක්‍රියා සන්දේශය* හා *රක්ඛංගදේශදූත ප්‍රයාණය* කිසිදු සඳහනක් නොකරන අතර *ස්‍යාමොපසම්පදාවත* සහ *විල්බාගෙදර මුදියන්සේගේ වාර්තාවේ* මෙරටට සියම් සාමණේරවරුන් සත් නමක් වැඩම කළ බවත්, *ස්‍යාම වණ්ණනාව* සියම් සාමණේරවරුන් අට නමක් වැඩම කළ බවත් දක්වයි.

මෙම ගණනය කිරීම් විමසිල්ලෙන් සළකා බලන විට වැඩම කළ සියම් භික්ෂූන් වහන්සේ ගණන දහ අටක් පමණ වෙතැයි යන සාධාරණ උපකල්පනයට එළඹීමට වැඩි අවස්ථාව හිමිවන්නේ වැඩි මූලාශ්‍රය ගණනක එය සඳහන් වීම සහ එකී භික්ෂූන් දහ අට නමගේ නාමයන් ද ලැයිස්තු ගතවී තිබීම හේතුවෙනි. එසේම සියම් සාමණේරවරු සත් නමක් වැඩම කළ බව වැඩි මූලාශ්‍රය ගණනක සඳහන් වීම මත නිගමනය කළ හැකිය. මේ පිළිබඳ කරුණු දක්වන වාචිස්සර හිමියෝ උන්වහන්සේට හමුවූ දන්ත ධාතු අෂ්ටක සන්නය නම් ලේඛනය පාදක කොටගෙන *ස්‍යාම වණ්ණනාවේ* සඳහන් වන කොට්ඨීත නම් හිමියන් ලංකාවේදී උපසම්පදාව ලැබූ සියම් සාමණේරයන් විය යුතු බව නිගමනය කරති (වාචිස්සර හිමි, 2003:139).

සියම් භික්ෂූන් වහන්සේලාගේ ආරක්ෂාව වෙනුවෙන් සියම් රජු විසින් රාජ නිලධාරීන් කිහිප දෙනෙක් ද මෙම දූත කණ්ඩායමට එක් කළ අතර ඔවුන් පිළිබඳව ද මූලාශ්‍රය අතර ඇත්තේ පරස්පරතාවකි. *ස්‍යාම වණ්ණනාවට* අනුව ලංකාවට පැමිණි සියම් ඇමතිවරුන් වූයේ ප්‍ර සූදන්ත මෙස්ත්‍රී, කුං මහාපෝන්, කුං වාචාපිරෝන්, කුං මහාපෝන්, කුං, කුං රත්නච්චිත් වන අතර *විල්බාගෙදර මුදියන්සේගේ වාර්තාවට* අනුව පුසුන්දමිස්ත, ලුවන් සී සෙනෙහා, කුන්වාචාපිරෝන්, කුන්මහාපෝන, කුන්රතනවිත යන සියම් තානාපතිවරු පස් දෙනා සියම් භික්ෂූන් සමග ලක්දිවට පැමිණි තිබේ (*ස්‍යාව*, 1998:77,102-103). එහෙත් *ස්‍යාමොපසම්පදාවතට* දක්වන්නේ රාජදූතය, උපදූතය සහ තෘතියදූතය යන අමාත්‍යවරුන් තිදෙනා සියම් භික්ෂූන්ගේ ආරක්ෂාවට පැමිණි බවයි (*සමො*, 1998:58).

කෙසේ වෙතත් පළමුව දැක්වුණු මූලාශ්‍රය ද්විත්වයේ දක්වන නාමයන්හි ඇති සමානකම සැළකිල්ලට ගෙන එය සියම් රාජ නිලධාරීන්ගේ නිවැරදි නාම ලේඛනය බව නිගමනය කළ හැකිය. කුං නමින් තවත් නිලධාරියෙක් පිළිබඳ *ස්‍යාම වණ්ණනාවේ* දක්වා තිබීම ලේඛනගත කිරීමේදී සිදුවූ දෝෂයක් විය යුතු ය. මේ පිළිබඳ වාචිස්සර හිමියන් දක්වන අදහස වන්නේ සියමෙන් නැව පිටත් වූ අවස්ථාවේ නැව අතරමග බිඳී ගිය හෙයින් ලුවංසි ස්නෙහො ආපසු සියමට යන්නට ඇති බවත්, සියමෙන් ආ ඇමතියෙකු ලංකාවේදී උපසම්පදා වූ බවත් *සංඝරාජ සාධු චරියාවේ* සඳහන් වන හෙයින් මෙරටට සියම් අමාත්‍යවරුන් තිදෙනෙකු පමණක් පැමිණි බව දක්වන *ස්‍යාමොපසම්පදාවතේ* සඳහන නිවැරදි විය යුතු බවයි (වාචිස්සර හිමි, 2003:139). එහෙත් මෙරටට සියම් ඇමතිවරුන් සිව් දෙනෙකු පැමිණ, ඉන් එක් අයෙකු ලක්දිව උපසම්පදා වූ බව දක්වන *සංඝරාජ සාධු චරියාවේ* සඳහන නිවැරදි නොවන බව වාචිස්සර හිමියන් විසින්ම කරුණු දක්වා තිබේ. එසේම සියම් ඇමතිවරුන්ගේ නම් සඳහන් කිරීමට පවා *ස්‍යාමොපසම්පදාවත* අපොහොසත් වන හෙයින් ලංකාවට සියම් ඇමතිවරුන් පස් දෙනෙකු පැමිණි බව පිළිගැනීම සාධාරණ බව පෙනේ.

රන් පිළිම, රන් පුස්තක හා සියම් රජුගේ සන්නස ආදී භාණ්ඩ රැගත් සියම් පිරිස ශ.ව. 1674 දී ලංකාවට පැමිණීමට නැව් නැඟි අතර විල්බාගෙදර මුහන්දිරම් ද ඔවුන් සමග සියම් නැවෙන් පැමිණ තිබේ. අනෙක් නිළමේවරුන් සිව්දෙනා ඇතුලු සෙසු පිරිස ඕලන්ද නැවකින් ලංකාව බලා පිටත්වුණි. (*සමො*, 1998:58). එහෙත් අතරමගදී සියම් නැව කැඩී ගිය හෙයින් වෙනත් නැවක් සපයාගන්නා තෙක් සියම් දූත පිරිසට රැඳී සිටීමට සිදුවිණි (*ස්‍යාව*, 1998:70-71). අනතුරුව බස්කාපැල් නම් නෞකාවෙන් ඔවුන් මෙරටට පැමිණි බව *පුණ්‍යක්‍රියා සන්දේශය* දක්වයි (ධම්මානන්ද හිමි, 1969:240).

ඒ වනවිට ඕලන්ද නැවෙන් පළමුව පිටත් වූ අනෙක් උඩරට නිළමේවරු සිව්දෙනා සියම් නැව එනතෙක් බතාවියේ සිට පසුව ලංකාවට පැමිණෙන්නට තීරණය කළහ. පසුව කොළඹට ගොඩබට

දූත පිරිස රජු බැහැ දැක සියම් දූත පිරිස පැමිණෙමින් සිටින බවත්, ඔවුන් පිළිගැනීමට ත්‍රිකුණාමලයට යා යුතු බවත් රජුට දන්වා සිටියේ ය (*සයාව*, 1998:71-72).

**සියම් උපසම්පදාව පිහිටුවීම**

ශ.ව 1675 වෙසක් මාසයේදී සියම් දූත පිරිස ත්‍රිකුණාමල වරායට පැමිණි අතර ඔවුන් පිළිගෙන පෙරහැරින් මහනුවරට වැඩම කරවීම සඳහා රජු විසින් රාජ නිලධාරීන් පිටත් කර හරින ලදී (*සමො*, 1998:59). මේ සඳහා පිටත් කෙරුණු රාජ නිලධාරීන් පිළිබඳ මූලාශ්‍රය එකිනෙකට වෙනස් තොරතුරු දක්වන බව පෙනෙන්නට තිබේ.

*මන්දාරම්පුර පුවතට* අනුව ගජනායක ඇසළපොළ වන්නි මැතිඳු, කොබ්බෑකඩුව, රත්වත්තේ, දඹගම, පිළිමතලාවේ, ගොලහැල, රඹපත, දිඹුලන, පලිපාන, පිලපිටි, ගලගොඩ, කිවුලේගෙදර, උඩුකිඳ, අංගම්මන, කපුලියද්දේ, අත්තරගම, මැදවෙල, නුගවෙල, දුල්ලෑව, දූනුවිල, උඩුවේ, හුළුගල්ලේ, ගන්තල, දවුලාගල, කප්පාගොඩ, යටවර, ගොඩමුන්නේ, බෝගමුවේ, ඇකිරිය, මහවැලිමඩ හා කොට්ටව ඇතුලු රාජ නිලධාරීන් තිස් හතර දෙනෙක් ද (*මපුපු*, 1958:664-666 කවි), *සයාම වර්ණනාවට* අනුව මහාදිකාරම් ඇහැලේපොළ, උඩ පලාතේ දිසාවේ ඇල්ලෙපොල කහඳමොහොට්ටාල, වෙඩික්කාර ලේකම් ඇල්ලේපොල මොහොට්ටාල, කුරුවේ ලේකම් කහඳ මොහොට්ටාල, වෑවල මොහොට්ටාල සහ හරස්ගමු මුහන්දිරම්රාළ ද (*සයාව*, 1998:73) සියම් දූතයන් පිළිගැනීමට රජු විසින් පිටත් කර තිබේ. සියමෙන් වැඩම කරවනු ලැබූ භික්ෂූන් වහන්සේලාට තමන්ගේ ගෞරවය ප්‍රකාශ කිරීමක් වශයෙන් ඔවුන් පිළිගැනීම සඳහා විශාල රාජ නිලධාරීන් පිරිසක් රජු විසින් පිටත් කරන්නට ඇති බව මෙයින් නිගමනය කළ හැකිය. ඉහත මූලාශ්‍රය ද්විත්වය සහ *සංඝරාජ සාධුචරියාවට* අනුව සත් කෝරලේ දිසාව හා පල්ලේගම්පහ අදිකාරම් වූ ඇහැළේපොළ මහ නිළමේ විසින් මෙම රාජ නිලධාරී කණ්ඩායම උදෙසා නායකත්වය ලබාදෙන්නට ඇත (*සංසාච*, 1997:17).

උඩරට නිලධාරීන් විසින් සියම් දූතයන් පිළිගෙන සංග්‍රහ සත්කාර ලබාදෙමින් අනතුරුව ගොඩපොල නුවරට කැඳවාගෙන ඒමට කටයුතු කරන ලදී (*සංසාච*, 1997:17). සියම් භික්ෂූන් පිළිගැනීම සඳහා මල්වතු පෝයමළු විහාර පදවිය හෙබවූ කොබ්බෑකඩුවේ සාමණේරයෝ සහ අස්ගිරි විහාර පදවිය හෙබවූ නාවින්නේ සාමණේරයෝ* සහ උභය විහාරයට අයත් සාමණේරවරුන් හා සරණංකර සාමණේරයන් ගොඩපොල නුවරට වැඩම කළ අතර ඒ අවස්ථාවට රජු නියෝජනය කරමින් හතර කෝරලේ දුම්බර දිසාවේ, මහලේකම් අංගම්මන මොහොට්ටාල, යටිනුවර රට මොලදණ්ඩේ රටේරාල, පඩික්කාර ලේකම් ඇල්ලේපොල කහඳව මොහොට්ටාල, පඩික්කාර ලේකමේ මුහන්දිරම් සහ විල්බාගෙදර කුඩා මුහන්දිරම් පැමිණ තිබේ (*සයාව*, 1998:73-74).

ගොඩපොළ නුවර සැතපෙනගේ අසළ නිමවූ මණ්ඩපයේදී සිදු වූ මෙකී හමුව ආරම්භයේදීම උපාලි මහ තෙරුන් වහන්සේ "සරණංකරො කො" යනුවෙන් සරණංකර සාමණේරයන් සමග කථා බස් කරන්නට යෙදුණු අතර ඒ ස්ථානයේදීම උපසම්පදාව සඳහා හික්මවීමට සරණංකර, තිබ්බටුවාවේ, කොබ්බෑකඩුවේ යන සාමණේරවරුන් බ්‍රහ්මජොති හිමියන්ට ද නාවින්නේ, මැදවෙල, දරම්ටිපල, ගිනිපත්පිටියේ යන සාමණේරවරුන් මහා පුඤ්ඤ හිමියන්ට ද භාර කළහ. එහිදී සිවුරු කඩ කපන ආකාරය සහ සියම් සිවුරුවල ප්‍රමාණය ලාංකික සාමණේරුවන්ට පෙන්වා දීම සිදුවුණු අතර තවත් ලාංකික සාමණේර හිමිවරුන් පිරිසක් උපසම්පදාව සඳහා හික්මවීමට අනෙක් සියම් මහ තෙරුන් වහන්සේලාගේ භාරකාරීත්වයට භාර කෙරුණි (*සංසාච*, 1997:17-18).

සියම් භික්ෂූන් වහන්සේ අලුත්ගංතොට ප්‍රදේශයේ පසුකරමින් සිටියදී රජු පෙර ගමන් ගොස් උන්වහන්සේලා පිළිගත් අතර මහනුවරට වැඩම කරවූ පසු සියම් භික්ෂූන්ට වැඩසිටීම සඳහා මල්වතු විහාරයේ නව ආවාස කරවා පූජා කරන්නට ද කටයුතු යොදා තිබුණි (*සමො*, 1998:59). මෙනිසා මල්වතු විහාරයට ධම්මිකාරාමය යන නාමය යෙදුණු බව *පුණ්‍යක්‍රියා සන්දේශය* දක්වයි (ධම්මානන්ද හිමි, 1969:249). එය සියම් රජුට ගරු කිරීමක් ලෙස යොදන්නට ඇත. සියම් රාජ

---

* *උන්වහන්සේලාගේ පැවිදි නාමයන් වූයේ කොබ්බෑකඩුවේ ශ්‍රීනිවාස හා නාවින්නේ ධම්මදස්සී බව පුණ්‍යක්‍රියා සන්දේශය* දක්වයි.

දූතයන්ට ද මිල මුදල් ලබා දී (*සමො*, 1998:59) නවාතැන් ලෙස බෝගම්බර තානායම සපයා දීමට රජු කටයුතු කළේ ය (*සයාව*, 1998:75). මේ අවස්ථාවේදී රජුගේ අණින් මඩුගල්ලේ, රාජපක්ෂ, වලස්මුල්ලේ සෙනරත් දහම්ධජපඬි, පුවක්ගොල්ලේ වීරසූරිය, මුල්ලේගම ඒකනායක, උඩගම දිසානායක, දෙහිගම නවරත්න, අරාවේ යන ඇමතිවරුන් සත් දෙනා සියම් දූතයන්ට කරන ගෞරවයක් වශයෙන් මග දෙපස ද, නගරය ද, මල්වතු අස්ගිරි උභය විහාරය ද, මාවත් ද අලංකාර අන්දමින් සරසා තිබූ බව කියැවේ (*මපුපු,* 1958:675-682 කවි).

පසුව එළඹුණු ඇසළ පොහොයට පෙර දිනයේ රජු විසින් මහ පෙරහරින් මල්වතු මහා විහාරයට පැමිණ සියම් භික්ෂූන් වහන්සේලාට ගිලන්පස පූජාවක් පවත්වා අනතුරුව උපාලි මහ තෙරුන්ට විසිතුරු වටාපතක් පිළිගන්වමින් උපසම්පදාව ආරම්භ කිරීමට ආරාධනා කරන ලදී (*මපුපු,* 1958:695-697 කවි). එහිදී මල්වතු විහාර මධ්‍යයේ පිහිටි ශාලාව පොහොය ගෙය වශයෙන් යොදා ගන්නා ලෙස ද රජු ඉල්ලා සිටියේ ය (*සංසාව*, 1997:18). එය පිළිගත් උපාලි මහ තෙරුන් විසින් මල්වතු වෙහෙර ග්‍රාම සීමාව ශුද්ධ කර (*මපුපු,* 1958:698 කවි) එය "විසුංගාම සීමාව" වශයෙන් නම් කිරීමෙන් (*සංසාව*, 1997:18-19) අනතුරුව එම සීමාව තුළ වෙනත් උපසම්පදා භික්ෂුවක් නොමැති බව නියමාකාරයෙන් දැන තමන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් සියම් සාමණේර නමක් පළමුව උපසම්පදා කොට තිබේ (*සයාව*, 1998:75).

*සයාමොපසම්පදාවතට* අනුව එම සියම් සාමණේරයන් උපාලි මහ තෙරුන් වහන්සේගේ ශිෂ්‍යයෙකු වූ බව දක්වෙන අතර (*සමො*, 1998:59) එම ශිෂ්‍ය සාමණේරයන්ගේ නම වත්සර බව *මන්දාරම්පුර පුවත* දක්වයි (*මපුපු,* 1958:698 කවි). එහෙත් සියම් රටින් පැමිණි අමාත්‍යයවරයෙකු පළමුව උපසම්පදා කරනු ලැබූ බව *සංඝරාජ සාධුචරියාවේ* දක්වෙතත්, (*සංසාව*, 1997:19) පළමුව සියම් හිමි නමක් උපසම්පදා කළ බවක් *රක්ඛංගදේශදූතප්‍රයාණය* හෝ *පුණ්‍යක්‍රියා සන්දේශය* නොදැක්වේ.

මේ පිළිබඳ විමසා බැලීමේදී වසර ගණනාවක් මෙරට නොපැවැත්වුණු උපසම්පදා කර්මය නැවත වරක් ආරම්භ කරන විට එහි මුල් අවස්ථාව සියම් සාමණේර නමකට හිමිවූ බව නිගමනය කිරීම යුක්ති යුක්ත බව පෙනේ. මෙරට සඟ සසුන ස්ථාපනය කළ මිහිඳු මහ රහතන් වහන්සේ විසින් ද ලංකාවේදී පළමු වරට පැවිදි කරවනු ලැබුවේ උන්වහන්සේ සමග පැමිණි භණ්ඩුක නම් උපාසක බව වංසකතාව දක්වයි (*මහාවංසො*, 2006:14 පරි. 31-32 ගාථා). එයින් ලක්වැසියන්ට පැවිද්ද පිළිබඳ අවබෝධයක් ලබාදීම උන්වහන්සේගේ අභිප්‍රාය වී තිබුණි. එලෙසින්ම නැවත වරක් ලංකාවේ උපසම්පදාව පිහිටුවීමේදී ඒ පිළිබඳ ලාංකික සාමණේරවරුන්ට අවබෝධයක් ලබාදීමේ අභිප්‍රායෙන් උපාලි මහ තෙරුන් විසින් ද සියම් සාමණේර නමක් පළමුව උපසම්පදා කරවන්නට ඇත. *සයාමොපසම්පදාවත* රචනා කෙරුණේ එකී උපසම්පදාවට පසුදින උපසම්පදාව ලැබූ තිබ්බටුවාවේ බුද්ධරක්ඛිත හිමියන් වීම හේතුවෙන් සියම් සාමණේර නමක් උපසම්පදා කළ බව තහවුරු වේ. මෙහිදී සියම් අමාත්‍යවරයෙකු උපසම්පදා කළ බවක් පිළිගත නොහැක්කේ ගිහි දිවියක් ගත කරමින් සිටි අයෙකුට පැවිදි වත් පිළිවෙත් හුරුවන්න කාලයක් නොතිබියදී උපසම්පදා කිරීමක් සිදු විය නොහැකි හෙයිනි. අනෙක් අතට රජ කෙනෙකුන් යටතේ වැටුප් ලබමින් සේවයේ යෙදී සිටින රාජ භටයන් පැවිදි කිරීම හෝ උපසම්පදා කිරීම නොකළ යුතු බවට බුදුන් වහන්සේ විනය නීතියක් පනවා තිබෙන අතර රාජ සේවයෙන් ඉවත් වූ විට පමණක් ඔවුන්ට පැවිද්ද හා උපසම්පදාව අනුදැන වදාරා තිබේ (චන්දවිමල හිමි, 1969:43). ඒ අනුව සියම් ඇමතිවරයාට රාජ සේවයෙන් ඉවත් වීමට තරම් කාලයක් නොතිබූ හෙයින් එවැන්නක් සිදු වූ බව පිළිගත නොහැක.

පසුව එළඹි ඇසළ පොහෝ දිනයේදී ලාංකික සාමණේරවරුන්ගේ උපසම්පදාව උපාලි මහ තෙරුන්ගේ උපාධ්‍යායත්වයෙන් ද, බ්‍රහ්මජෝති හා මහාපුඤ්ඤ යන කම්මවාචා හිමිවරුන්ගේ ආචාර්යත්වයෙන් ද සිදු කරන ලදී (*සංසාව*, 1997:19). ලාංකික භික්ෂූන්ගේ උපසම්පදාව සිදු කෙරුණු අනුපිළිවෙල පිළිබඳ මූලාශ්‍රය අතර පරස්පරතාවක් පවතින බව පෙනේ. මල්වතු විහාරයේ නායක කොබ්බෑකඩුව, වැලිවිට සරණංකර, හුලංගමුවේ, බඹරදෙණියේ, තිබ්බටුවාවේ සහ අස්ගිරි විහාරයේ නායක නාවින්නේ යන සාමණේරවරුන් සය නම පිළිවෙලින් උපසම්පදා කරනු ලැබූ බව *සයාමොපසම්පදාවත* සහ *සයාම වණ්ණනාව* දැක්වුව ද, (*සමො*, 1998:59 සහ *සයාව*, 1998:75), *මන්දාරම්පුර පුවතට* අනුව මල්වතු විහාර නායක කොබ්බෑකඩුවේ, අස්ගිරි විහාර නායක නාවින්නේ ධම්මදස්සී, වැලිවිට සරණංකර, හුලංගමුවේ, බඹරදෙණියේ, තිබ්බටුවාවේ සාමණේරවරුන් පිළිවෙලින් උපසම්පදා කොට තිබේ (*මපුපු,* 1958:701-704 කවි).

මේ පිළිබඳ විග්‍රහයක් කරන වාචිස්සර හිමියන් දක්වන්නේ *මන්දාරම්පුර පුවත* හැරෙන්නට මෙම උපසම්පදාව පිළිබඳ විස්තර ලියූ සියලු ගත්කරුවන් මල්වතු විහාරයට අයත් වූවන් හෝ එයට හිතවත් අයවලුන් වූ හෙයින් මල්වතු අස්ගිරි භේදය මත අස්ගිරියේ නාවින්නේ හිමියන් සුළු කොට තැකීමට උත්සහ ගෙන ඇති බවයි. එසේම උපසම්පදාව පිහිටුවීම සඳහා තමන්වහන්සේ පුරෝගාමී වූ හෙයින් පළමුව උපසම්පදාව ලබා ගත හැකියාව තිබියදී උභය විහාරයේ නායක හිමිවරුන්ට මුල් තැනක් ලබාදීමෙන් සරණංකර සාමණේරයන් දැක්වූ සැලකිල්ල හා නිහතමානීත්වය පිළිබඳ වාචිස්සර හිමියෝ විශේෂයෙන් අගය කරති (වාචිස්සර හිමි, 2003:181). ඒ නිසා මල්වතු විහාරයේ නායක කොබ්බෑකඩුවේ සාමණේරයන් සේම අස්ගිරි විහාරයේ නායක නාවින්නේ සාමණේරයන් ද තමන්වහන්සේට වඩා ජ්‍යෙෂ්ඨ එමෙන්ම උභය විහාරයේ නායකත්වය උසුලන්නන් වූ හෙයින්, කොබ්බෑකඩුවේ සාමණේරයන්ට පමණක් උපසම්පදා වීමේ පළමු අවස්ථාව ලබාදී දෙවන අවස්ථාව නාවින්නේ සාමණේරයන්ට ලබා නොදීමට තරම් සරණංකර සාමණේරයන් අවස්ථාවාදී වූ බව සිතිය නොහැක.

උපසම්පදා මංගල්‍යයෙන් අනතුරුව රජු විසින් ධර්මශාලාවේ වැඩසිටි උපසම්පදා භික්ෂූන් වහන්සේලාට වස් විසීම සඳහා ආරාධනා කළ අතර නවක උපසම්පදාලාභී ලාංකික භික්ෂූන් සය නම සහ සියම් භික්ෂූන් වහන්සේ ඒ අනුව වස් එළඹුණහ (*සමෙ*, 1998:60). *රක්ඛංගදේශදූතප්‍රයාණය* දක්වන ආකාරයට පේගු දේශයෙන් වැඩම කළ සීලාලංකාර උත්තමරාම නම් භික්ෂුව ද මේ සමග වස් එළඹි අතර (ධම්මානන්ද හිමි,1969:103) සියම් දූත පිරිස ලංකාවට පැමිණෙන අතරවාරයේදී නැව බිඳී ගිය හෙයින් වෙනත් නැවක් පැමිණෙන එනතෙක් ඔවුන් රැඳී සිටියදී මෙම පේගු භික්ෂුව දූත පිරිසට එක්වන්නට ඇතැයි අනුමාන කළ හැකිය.

උපසම්පදා කර්මය සඳහා යොදා ගැනුණු ශාලාව දිරාපත් වෙමින් තිබූ හෙයින් වස් කාල සීමාවේදී රජු විසින් එම ශාලාව ඉවත් කොට නව පොහොය ගෙයක් ඉදිකරවීමට දිගින් පනස් රියනක් ද, පළලින් රියන් විසි හයකින් ද යුත් බිමක් තෝරා ගන්නා ලදී. අනතුරුව උපාලි මහ තෙරුන් ප්‍රමුඛ සියම් ස්ථවිරයන් වහන්සේ ලංකාවේ උපසපන් වූ නවක උපසම්පදා භික්ෂූන් සත් නම හා එක්ව බුදුන් වහන්සේ වදාළ විනය නීතිවලට අනුකූලව භූමියේ අට කොණ පාෂාණ නිමිති පිහිටුවා බද්ධසීමාව සළකුණුකොට සියම් රජු ලබාදුන් රන්පොතේ වූ කර්ම වාක්‍ය කියවා විසුංගාම සීමාව බද්ධසීමාවක් ලෙස සම්මත කළහ. පසුව රජු විසින් එම සීමාව තුළ පොහොය ගෙයක් ඉදිකරවන ලදී (*සමෙ*, 1998:60-62). මේ කාලය අතරතුරදී සියම් රජු විසින් එවන ලද රාජකීය සන්දේශය මගුල් මඩුවේදී රජු සහ රදළයන්ට කියවීමට ද සරණංකර හිමියන් හා තිබ්බටුවාවේ හිමියන් කටයුතු කළ බව කියැවේ (*සයාව*, 1998:76).

වස් කාලය නිමවීමෙන් පසු රජු විසින් සංඝරාජ තනතුරට හා නායක පදවි දෙකකට උචිත වටාපත් රැගෙන මල්වත්තේ පොහොය ගෙයට පැමිණ වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය ද, උන්වහන්සේ අනුශාසනා පරිදි තිබ්බටුවාවේ හිමියන්ට මල්වතු මහානායක ධූරය හා උරුලෑවත්තේ හිමියන්ට අස්ගිරි මහානායක ධූරය පිරිනමා සඟ සසුනේ පැවැත්ම සඳහා කටයුතු සම්පාදනය කරන ලදී (*සංසාව*, 1997:19-20). මෙය සිදුවූයේ දළදා මාළිගාවේදී බව *මන්දාරම්පුර පුවත* දක්වන අතර මහානායක ධූර ද්විත්වය උප සංඝරාජ තනතුරු ලෙස ප්‍රකාශ කළ රජු තුන් සිංහලයේ පිහිටි 4800 ක් වූ විහාර උභය විහාරවලට වෙන් කොට භාර දීම ද ඒ අවස්ථාවේදී සිදුකොට තිබේ (*මපුප*, 1958:713-721 කවි). ඉහළ සිට පහළට විහිදී යන විධිමත් සංඝ පාලන තන්ත්‍රයක් ඇති කිරීම මෙමගින් රජු අපේක්ෂා කළ අතර අද දක්වා එකී ක්‍රමය උභය විහාර තුළ පවත්වාගෙන යනු ලබයි.

පළමු උපසම්පදාවෙන් පසුව එළඹි තුන් අවුරුද්ද තුළ සත්සීයක් සාමණේරයන් උපසම්පදා කරවා තවත් තුන් දහසක් පැවිදි කරවන්නට සහ ස්ථාන කිහිපයක සීමා මාලක පිහිටුවා උපසම්පදා කර්මය ලංකාව පුරා ව්‍යාප්ත කිරීමට ද උපාලි මහ තෙරුන් ප්‍රමුඛ මහා ස්ථවිරයන් වහන්සේලා විසින් කටයුතු කරන ලදී (*සමෙ*, 1998:63). ඒ යටතේ අස්ගිරිය, සත්කෝරළ රජමහ විහාරය, මැද්දේපොළ, දඹදෙණිය හා මඩවල යන විහාරස්ථානවල බද්ධ සීමා බඳවා තිබේ (*සංසාව*, 1997:19-20). *පුණ්‍යක්‍රියා සන්දේශයට* අනුව ඉහත විහාරවලට අමතරව මහියංගණය, අරත්තන, ගඩලාදෙණිය, වෙලගම, දෙවනගල, දියසුන්නත, වට්ටාරම, රිදීගම, කඳුලව, වරාවල, අංගලගම, බඩගමුව, හලඹගල, තිස්සව, මාවතපල, වේරගොඩ, අලුවිහාරය, හුරීකඩුව, කරවුලියැද්ද ආදී ස්ථාන විසිපහක බද්ධ සීමා කරවූ බව පෙනේ (ධම්මානන්ද හිමි,1969:250).

උපාලි මහ තෙරුන් විසින් මේ කාලය තුළදී ලාංකීය භික්ෂූන් වහන්සේලාට ප්‍රාතිමෝක්ෂ ගණ ශික්ෂා පද, කැප අකැප වස්තු, පටිග්ගහණ ශික්ෂා පද, පොහෝ පවුරුණු, වස් විසීම, කඨින චීවර පූජාව, සාමණේර උපසම්පදාව ආදියේ කර්ම වාක්‍ය ආදිය ඇතුලු විනය කොටස් පිළිබඳ ඉගැන්වීමට කටයුතු කරන ලදී (*සංසාච*, 1997:20). එසේම රජුගේ මැදිහත්වීමෙන් මහාපුඤ්ඤ, බ්‍රහ්මජෝති, චන්දසර, සාරචන්ද හා මණිජෝති යන කර්මාචාරීන් වහන්සේලාට කර්ම වාක්‍ය ආදිය ඉගැන්වීම පිණිස ලාංකික භික්ෂූන් වහන්සේ විසිපස් නමක් භාර කෙරුණු අතර මහානාම, බ්‍රහ්මස්සර හිමිවරුන්ට උදෙසා ආරණ්‍යයක් ඉදිකරවා විදර්ශනාධූරයේ හික්මවීමට තවත් විසි හතර නමක් භාර කෙරුණි (ධම්මානන්ද හිමි,1969:249).

මේ සෑම කටයුත්තක් තුළින්ම අවධාරණය කෙරෙන්නේ සිල්වත් භික්ෂු පරපුරක් ඇති කරවීම වෙනුවෙන් සියම් භික්ෂූන් වහන්සේ සේම රජු ද සුවිසල් අනුග්‍රහයක් දැක්වූ බවයි. විශේෂයෙන්ම පැවිදි දිවිය සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය සෑම අංගයක්ම පාහේ ඉගැන්වීමට කටයුතු කිරීම තුළින් ලංකාවේ පිහිටවුණු සියම් උපසම්පදාවේ චිරස්ථිතිය තහවුරු කරලීමට ද සියම් භික්ෂූන් වහන්සේ කටයුතු කළ බව පෙනේ.

මුල් උපසම්පදා මංගල්‍යයෙන් පසු උපාලි මහ තෙරුන් ප්‍රමුඛ සියම් තෙරුන් වහන්සේලා සහ සියම් අමාත්‍යවරුන්ට අනුරාධපුර, මහියංගණ ආදී පූජනීයස්ථාන ද, දළදා වහන්සේ ද වන්දනා කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාව රජු විසින් සලසා දුන් අතර පසුව බොහෝ පුද පඬුරු ද සමග අමාත්‍යවරුන් තිදෙනා නැවත සියමට බලා පිටත් කර හැරීමට ද කටයුතු කර ඇත. වසර තුනක් පුරා උපසම්පදාව ලංකාව තුළ ස්ථාපනය කිරීම සඳහා වෙහෙසුණු සියම් මහතෙරුන් වහන්සේලා ද අනතුරු ව සියම බලා පිටත් වුණු අතර පසුව සියමෙන් සුවිශුද්ධාචාර්ය, වරඤාණමුනි, චන්දසාර, ධම්මස්සර, ඉන්දජෝති, සුවණ්ණජෝති යන මහ ස්ථවිරයන් වහන්සේලා මෙරටට වැඩම කර තිබේ (*සමෞ*, 1998:62-63). ඒ සමඟ බුන් විසුද්ධ මෛත්‍රී, මුන්වාදි භිචිත්, මුන්විචිධසින්හෝ යන රාජ පුරුෂයන් ද ආරක්ෂාවට පැමිණි බව දැක්වේ (*සයාච*, 1998:79).

උන්වහන්සේලා විසින් විදර්ශනා භාවනාව ආදී කටයුතු සම්බන්ධව ලාංකික භික්ෂූන් වහන්සේ පුහුණු කොට නැවත සියරට බලා වඩින ලදී. ලක්දිව වැඩ විසූ තෙවසරක කාලය තුළදී උන්වහන්සේලා සාමණේරවරු තුන්සිය නමක් උපසම්පදා කිරීමට සහ තවත් සිය ගණනක් පැවිදි කිරීමට ද (*සමෞ*, 1998:63-64), ගිනිගත්පිටිය, මුතුගල, ඇන්නෝරුව, කළුන්දාව ආදී විහාරවල තවත් බද්ධ සීමා බැඳීමට ද කටයුතු කළහ (*සංසාච*, 1997:21). මේ පිළිබඳ අතිශය සතුටු වූ රජු සියමේ ධාර්මික රජු වෙත තවත් වටිනා ත්‍යාග සමග දූත පිරිසක් පිටක් කළ අතර එයට පළමු වර ලංකාවට වැඩම කළ සියම් භික්ෂූන්ගෙන් ඉතිරිව සිටි භික්ෂූන් වහන්සේලා අයත්ව සිටි බව කියැවේ (*සමෞ*, 1998:63).

තෙවන වරට ද සියම් භික්ෂූන් වහන්සේ කණ්ඩායමක් මෙරටට වැඩම කළ බව *පුණ්‍යක්‍රියා සන්දේශය* දක්වතත් පැමිණි පිරිසගේ නම් හෝ වෙනත් තොරතුරු කිසිවක් එහි දක්නට නොමැති අතර (ධම්මානන්ද හිමි,1969:252) වෙනත් මූලාශ්‍රයක ද මේ පිළිබඳ කරුණු දැකගත නොහැක. මේ අන්දමින් දිගින් දිගටම සියම් භික්ෂු කණ්ඩායම් මෙරටට වැඩම කරවීම තුළින් සියම් සංඝරාජයන් වහන්සේ ඇතුලු සියම් භික්ෂූන් වහන්සේ තුළ ලංකාවේ පිහිටවුණු උපසම්පදාවේ චිරස්ථිතිය උදෙසා දිගුකාලීන වැඩපිළිවෙලක් සකස් කොට තිබූ බව පෙනේ.

දෙවන වරට සියම් භික්ෂූන් වහන්සේ ලංකාවට වැඩමකොට සිටි කාලයේදී ගිලන්ව සිටි උපාලි මහ තෙරුන් වහන්සේ පෝයමළු විහාරයේදී අපවත් වූ අතර අස්ගිරි විහාරයේ බැඳවූ චිතකයක් තුළ භික්ෂූන් වහන්සේගේ සහ රජු ඇතුලු ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් රාජ ගෞරව සහිතව උන්වහන්සේගේ දේහය ආදාහනය කොට පින්කම් සිදුකරවා තිබේ. ඊට පසුව මණිජෝති මහා තෙරුන් වහන්සේ හා පළමුව සියම් උපසම්පදාව ලැබූ සියම් තෙරුන් වහන්සේ අපවත් වූ අතර මල්වතු විහාරයේදී සහ සත්කෝරළ රජමහ විහාරයේදී උන්වහන්සේලා ආදාහනය කොට දාගැබ් බැඳවූ බව කියැවේ (*සංසාච*, 1997:21-22).

මුල් උපසම්පදාවේ සිට වසර දහයක් පමණ ගතවනතුරු ලාංකික භික්ෂූන් වහන්සේලාගේ උපසම්පදා කටයුතු සම්බන්ධව සියම් භික්ෂූන් වහන්සේ පමණක් කටයුතු කළ බව පෙනෙන අතර එයට හේතුව වන්නට ඇත්තේ බුද්ධ නීතිය අනුව උපසම්පදාවෙන් පසු භික්ෂුවක් පස් වසක් උපාධ්‍යයන් වහන්සේ සමීපයේ හිඳ කටයුතු කළයුතු වීමත්, උපාධ්‍යාය වීමට නම් උපසම්පදාවෙන් දස වස් ඉක්ම තිබිය යුතු වීමත් විය යුතුය (චන්දවිමල හිමි, 1969:71-72).

ඒ අනුව සරණංකර සංඝරාජ හිමියන් උපසම්පදාවෙන් දොළොස් වස් ගතවූ පසු එනම් ශ.ව. 1686 දී උන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් හා කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ සහභාගීත්වයෙන් ඉල් මස පසළොස්වක දිනයේදී ලාංකික භික්ෂූන් විසින් සිදුකරනු ලැබූ පළමු උපසම්පදා මංගල්‍යය ආරම්භ කර තිබේ (*සමො*, 1998:65). පළමු දිනයේ උපසම්පදා අපේක්ෂක සාමණේරවරුන්ගෙන් දම්පියා, සතර කමටහන්, පිරිත්, සතර බණවර ආදිය පාඩම් ගත් බවත්, එයින් ව්‍යක්ත සම පනසක් සාමණේරවරුන් තෝරාගෙන තෙවෙනි දිනයේ උන්වහන්සේලා රාජාභරණයෙන් සරසා පෙරහැරින් දළදා වහන්සේ වන්දනා කිරීම සඳහා ගෙනගොස් පසුව පෙරහැරින් ඇතුන් පිට නගරයේ වීථි සංචාරය කරවා නැවත දළදා මැදුරට ගෙන්වා රජු සහ ඇමතිවරුන්ගෙන් පිරිකර පූජා ලබා පෙරහැරින් උභය විහායට ගෙනගොස් උපසම්පදා කර තිබේ. අනතුරුව උන්වහන්සේලා පනස් නමට දානය රජු විසින් දළදා මැදුරේදී පිළිගන්වන ලදී (*මපුපු*, 1958:815-821 කවි).

ඒ අන්දමින් නැවත වරක් ලාංකික භික්ෂූන් වහන්සේ විසින් උපසම්පදා විනය කර්මය පවත්වා ගෙන යාම ආරම්භ කළ අතර එහි චිරස්ථිතිය වෙනුවෙන් වැලිවිට සරණංකර සංඝරාජයන්ගේ මූලිකත්වයෙන් ශාසන කතිකාවතක් සහ රාජාධි රාජසිංහ රජ දවස මල්වතු මහානායක මොරතොට ධම්මක්ඛන්ධ නාහිමියන්ගේ මූලිකත්වයෙන් ශාසනික කතිකාවතක් ද ඇතිකිරීමට කටයුතු කළ බව පෙනේ (ජයතිලක, 2002:27-71).

**සමාලෝචනය**

උඩරට රාජධානිය ආරම්භ කළ සමයේ පටන් සාර්ථකව උපසම්පදාව ස්ථාපනය කිරීම සඳහා රජදරුවන්ගෙන් නොමඳ අනුග්‍රහයක් හිමිවුව ද, එය සාර්ථකව ස්ථාපනය නොවීමට බලපෑ කරුණු කිහිපයක් දැකගත හැකිය. රක්ඛංග දේශයෙන් දෙවරක් උපසම්පදා භික්ෂූන් වැඩමවා උපසම්පදාව පිහිටුවීම සිදු කළ නමුත් එය පවත්වා ගෙන යාම සඳහා වැඩපිළිවෙලක් අනුගමනය කිරීමට රක්ඛංග තෙරුන් වහන්සේලා විසින් උත්සාහ නොකිරීම ඒ සඳහා බලපෑ ප්‍රධාන කරුණකි. බුදුන් වහන්සේ අනුදැන වදාළ පැවිදි විනය නීතිවලට අනුව නවක උපසම්පදාලාභී භික්ෂුවක් වසර පහක් පමණ තම උපාධ්‍යායවරයා සමීපයේ සිට පැවිදි දිවියේ හික්මිය යුතු අතර උපසම්පදාවෙන් වසර දහයක් ගතවීමෙන් අනතුරුව උපාධ්‍යායවරයෙක් වශයෙන් කටයුතු කිරීමට අවකාශ හිමිවේ. එහෙත් රක්ඛංග භික්ෂූන් වහන්සේ උපසම්පදාව ලබා දීමෙන් අනතුරුව ලංකාවේ රැඳී සිටිමින් නවක උපසම්පදාලාභී ලාංකික භික්ෂූන් පැවිදි දිවියේ හික්මවූ බවක් නොදැක්වෙන හෙයින් ලාංකික භික්ෂූන් පැවිදි දිවියේ හික්මවීමක් හෝ පසුව උපාධ්‍යාය වශයෙන් තවත් සාමණේරවරුන් පැවිදි කරවීමට හැකියාවක් ලබාගත් බවක් නොපෙනේ. මෙනිසා ඉහත අවස්ථා ද්විත්වයේදී රක්ඛංග භික්ෂූන් වහන්සේ විසින් උපසම්පදා කරනු ලැබූ ලාංකික භික්ෂූන් වහන්සේ ජීවමානව වැඩ සිටින තාක් උපසම්පදාව පැවතුණු අතර උන්වහන්සේලාගේ අපවත් වීමෙන් එකී උපසම්පදාව නැතිවුණු බව පෙනෙන්නට තිබේ.

අනෙක් අතට රක්ඛංග දේශයේ පැවති බුදු දහම හින්දු සහ මහායාන බලපෑමට ලක්ව තිබීම හේතුවෙන් ථෙරවාදය අනුගමනය කරන ලංකාව තුළ රක්ඛංගයෙන් ලැබුණු උපසම්පදාවට පිළිගැනීමක් ලැබුණේ ද යන ගැටලුව මතුවන හෙයින් රක්ඛංග උපසම්පදාව කෙටි කලකින්ම නැතිව යාමට එයින් ද යම් බලපෑමක් එල්ල වන්නට ඇත.

එහෙත් සියම් උපසම්පදාව පිහිටුවීම වඩා විධිමත් අන්දමින් සිදු වූ බව පෙනෙන අතර ලක්දිවට වැඩම කළ සියම් භික්ෂූන් වහන්සේ දිගු කලක් ලංකාවේ රැඳී සිටිමින් උපසම්පදා කර්ම සහ කුලදරුවන් පැවිදි කිරීම සිදුකළා සේම නවක උපසම්පදාලාභී භික්ෂූන් පැවිදි දිවියේ හික්මවීමට ද අවශ්‍ය පියවර ගන්නට යෙදුණි. එහිදී ලාංකික භික්ෂූන් ග්‍රන්ථධූර මෙන්ම විදර්ශනාධූරයේ ද ප්‍රවීණයන් බවට පත් කිරීමට කටයුතු කෙරුණු අතර පළමුව වැඩම කළ සියම් භික්ෂූන් වහන්සේ පෙරලා සියරටට වැඩම කිරීමෙන් පසුව දෙවන හා තුන්වන වශයෙන් සියම් භික්ෂු කණ්ඩායම් මෙරටට වැඩමකොට සියම් උපසම්පදාව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සැලසූ බව පෙනේ. මෙහි ප්‍රතිඵලය වූයේ සියම් උපසම්පදාව පිහිටුවා වසර දොළහක් ඇවෑමෙන් බුදුන් වදාළ විනය නීතිවලට අනුකූලව ලාංකික භික්ෂූන් වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් උපසම්පදා මංගල්‍යයක් පවත්වා සියම් උපසම්පදාව දේශීය භික්ෂූන්ගේ අතට පත්කරගැනීමයි.

යථෝක්ත මාතෘකා පිළිබඳ විමසා බැලීමේදී ඒ හා සමකාලීනව ලියවුණු මූලාශ්‍රය රැසක් දැකගත හැකිවුව ද එකිනෙකට වෙනස් කරුණු ඒ තුළ අන්තර්ගත වීම පැහැදිලිව දැකගත හැකි වූ

කරුණකි. එවන් තත්ත්වයක් තුළ වැඩි මූලාශ්‍රය ගණනක දක්වන කරුණ පිළිගැනීමට සිදුවන අවස්ථා විරල නොවේ. එහෙත් වැඩි මූලාශ්‍රය ගණනක රචකයන් මල්වතු විහාර පාර්ශවයට අයත් වූවන් හෝ හිතවත් අයවලුන් වීම හේතුවෙන් විටෙක අස්ගිරි විහාර පාර්ශවය සුළු කොට තකමින් කරුණු ඉදිරිපත් කිරීම ද සිදුව ඇති හෙයින් ඒ පිළිබඳ සැලකිලිමත් වීම වටී.

කෙටි යෙදුම්

| | |
|---|---|
| *මන්දාරම්පුර පුවත* | *මපුපු* |
| *සංඝරාජ සාධු චරියාව* | *සංසාච* |
| *සඟරජවත* | *සව* |
| *ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන* | *ස්‍යාව* |
| *ස්‍යාමොපසම්පදාවත* | *සමො* |

**ආශ්‍රිත ග්‍රන්ථ**

*මන්දාරම්පුර පුවත* (1958), ලංකානන්ද හිමි, ලබුගම, (සංස්.), සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.

*මහාවංසො* (2006), ඉලංගසිංහ, මංගල (සංස්.), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

*මහාවංසය-සිංහල* (2003), විජේසේකර, නන්දදේව (සංස්.), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

*සංඝරාජ සාධු චරියාව* (1997), විමලවංස හිමි, අකුරටියේ සහ සෙනෙවිරත්න, නාගොඩ ආරියදාස (සංස්.), සමයවර්ධන, කොළඹ 10.

*සඟරජවත* (1955), ද සිල්වා, ශ්‍රී චාල්ස් (සංස්.), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

*ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන* (1998), පඤ්ඤාලෝක හිමි, මීගොඩ (සංස්.), එස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

*ස්‍යාමොපසම්පදාවත* (1998), සිරි රතනාලංකාර හිමි, හග්ගමුවේ (සංස්.), එස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

චන්දවිමල හිමි, රේරුකානේ (1969), *විනය කර්ම පොත*, අනුල මුද්‍රණාලය, මරදාන.

චන්දවිමල හිමි, රේරුකානේ (1970), *උපසම්පදා ශීලය*, අනුල මුද්‍රණාලය, මරදාන.

ජයතිලක, ඩී.බී. (2002), *කතිකාවත් සඟරා*, එස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

ධම්මානන්ද හිමි, නාවුල්ලේ (1969), *මධ්‍යම ලඞකා පුරාවෘත්ත*, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

වාචිස්සර හිමි, කොටගම (2003), *සරණඞකර සඞඝරාජ සමය*, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

Knox, Robert (2004), *An Historical Relations of Island of Ceylon*, Navrang, New Delhi.